## WEATHER FORECAST FOR 22nd June 2019
### (Issued at 1200 noon on 21st June 2019)

**Windy condition over the island and showery condition in the south-western part is likely to continue during next few days. There is a high possibility to occur strong gusty winds up to 50-60 kmph in Western, Central, Sabaragamuwa, Southern, North-western and North-central provinces and in Trincomalee and Monaragala districts. Fairly strong gusty winds up to 40-50 kmph elsewhere.**

Showers or thundershowers will occur at times in Western, Sabaragamuwa and Central provinces and in Galle and Matara districts. Several spells of showers will occur in North-western province and in Hambantota district.

Heavy falls about 100 mm can be expected at some places in Sabaragamuwa and Central provinces and in Kaluthara and Matara districts. Fairly heavy falls about 50 mm can be expected at some places in Colombo, Gampaha and Galle districts.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

දිවයින හරහා සුළගේ වේගය ඉහළ යාම සහ දිවයිනේ නිරිත දිග කොටසේ පවතින වැසි තත්වය, ඉදිරි දින කිහිපයේදී තවදුරටත් බලාපොරොත්තුවේ. බස්නාහිර, මධ්‍යම, සබරගමුව, දකුණු, වයඹ සහ උතුරු-මැද පළාත්වලත් ත්‍රිකුණාමලය සහ මොණරාගල දිස්ත්‍රික්කවලත් විටින් විට හමන පැ.කි.මී. 50-60 දක්වා තද සුළං සහ සෙසු ප්‍රදේශවල පැ.කි.මී. 40-50 දක්වා තරමක් තද සුළං ඇතිවීමේ ඉහල හැකියාවක් පවතී.

බස්නාහිර, සබරගමුව සහ මධ්‍යම පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වන අතර වයඹ පළාතේ සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැසි වාර කිහිපයක් ඇතිවේ.

සබරගමුව සහ මධ්‍යම පළාත්වලත් කළුතර සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට මි.මී. 100 ක පමණ තද වර්ෂාපතනයන් ද කොළඹ, ගම්පහ සහ ගාල්ල දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථාන වලට මි.මී. 50 ක පමණ තරමක තද වර්ෂාපතනයන් ද ඇති විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 1200 noon on 21st June 2019)

Showers or thundershowers will occur at times in the sea area off the coast extending from Puttalam to Hambantota via Colombo and Galle.

Winds will be South-westerly and speed will be 30-40 kmph in the sea areas around the island.

The sea area off the coast extending from Puttalam to Pottuvil via Colombo and Galle will be rough to very rough at times as the wind speed can increase up to 70 kmph.

Wind speed can increase up to 50 kmph in the sea area off the coast extending from Trincomalee to Kankasanturai via Mullaitivu.

**Naval and fishing communities are requested to be vigilant in this regards.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය
### 2019 ජූනි මස 21 දින මධ්‍යහන 1200 ට නිකුත් කරන ලදි.

පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

දිවයින වටා මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. 30-40 පමණ වේ.

පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 70 දක්වා වැඩි විය හැකි අතර මෙම මුහුදු ප්‍රදේශ විටින් විට රළු හෝ ඉතා රළු වේ.

ත්‍රිකුණාමලයේ සිට මුලතිව් හරහා කන්කසන්තුරය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 50 දක්වා වැඩි විය හැක.

ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිලිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. .

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date 2019/06/21
Time 1206 hrs
D (Ops)/DC/ADO
DISASTER MANAGEMENT CENTRE

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)